# එතෙර යයි

**ලෝක** විශ්ව විද්‍යාල මණ්ඩලය, රාජ්‍ය නොවන ආයතනවල ලෝක සංවිධානය සහ අන්තර් ආගමික, අන්තර් ජාතික එකතුව මගින් සංවිධානය කරන ජාත්‍යන්තර නායකත්ව ආසියා පැසිපික් සමුළුව පසුගියද බැංකොක් නුවර, ඉම්පීරියල් තුයින් පාර්ක් මධ්‍යස්ථානයේදී තායිලන්ත අග්‍රාමාත්‍ය තක්ෂින් ෂිනවත්‍රා මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය.



ආසියා පැසිපික් කලාපයේ රටවල් 30 ක ඇමැතිවරුන්, විශ්ව විද්‍යාල ප්‍රධානීන් සහ සමාජයීය නායකයින්ගේ සහභාගිත්වයෙන් නියමිත මෙම සමුළුවට "ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාසේවා නායකයින්ගේ ස්වරූපය හැඩගැසිය යුතු ආකාරය" යන මැයෙන් දේශනයක් පැවැත්වීමට ඇරයුම් ලැබ ශ්‍රී ලංකා - එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් සාම නානාපති ආචාර්ය දේශප්‍රිය එස්. විජේතුංග මහතා පසුගියද දිවයිනෙන් පිටව ගියේය. මෙම තායිලන්ත සංචාරයේදී එම රටේ ඇමැතිවරුන් සහ සෙනෙට් සභිකයින් හමුවීමටද ආසියා පැසිපික් කලාපයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික සහ සමාජයීය කොමිසමේ නිලධාරීන් හමුවීමටද තායිලන්ත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නායකයින් හමුවීමට ද එරට විශ්ව විද්‍යාල හා අධ්‍යාපනික ආයතන නැරඹීමට ද විජේතුංග මහතා බලාපොරොත්තු වේ.